# ජාතික ආරක්ෂාව හා
# ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය
# ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
# ඇබෑර්තු

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකා පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. විද්‍යාඥ - AR - 1. ii වන ශ්‍රේණිය (තනතුරු 19)

**පහත සඳහන් කාණ්ඩවල**

**ඉංජිනේරු ( සිවිල් / යාන්ත්‍රික ) - 06**

**භූ විද්‍යාඥ -08**

**(දිස්ත්‍රික් කාර්යාල : රත්නපුර - 03, නුවරඑළිය - 01, කළුතර - 02, ගාල්ල - 02)**

**පරිසරවේදී -01**

**නගර සැලසුම්කරු - 01**

**භෞතික විද්‍යාව -01**

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් සිව් වසරක ඉංජිනේරු / විද්‍යා / තාක්ෂණ හෝ ගැලපෙන විෂය සංයෝජනයෙන් යුත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් ලබා තිබීම **හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් තෙවසරක විද්‍යාව හෝ ගැලපෙන විෂය සංයෝජනයෙන් යුත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් ලබාතිබීම **හා**

පශ්චාත් උපාධියක් / ඉංජිනේරු / විද්‍යා / භූ විද්‍යා හෝ අදාළ ක්ෂේත්‍රයේ ඩිප්ලෝමාවක් ලබා තිබීම **හෝ**

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

| | | |
|---|---|---|
| **සටහන** | - | තනතුරට අදාළ පර්යේෂණ පළපුරුද්ද වැඩි වාසියක් ලෙස සලකනු ලැබේ. |
| **වැටුප් පරිමාණය** | - | AR-1-රු. (51,285 –1135X5 –1335X5 – 1590X15 – 87,485 |
| **ආරම්භක පියවර** | - | අංක 2/2016 දරන කළමනාකරණ චක්‍ර ලේඛය ප්‍රකාරව රු. 51,285/- වේ. |
| **වයස** | - | අවු 22 ට අඩු නොවිය යුතු අතර, අවු 45 ට වැඩි නොවිය යුතුය. |

## 02. කළමනාකරණ සහකාර (තාක්ෂණික) - MA 2-2, iii ශ්‍රේණිය

**(සිවිල් / ප්‍රමාණ සමීක්ෂක / සැලසුම් ශිල්පීන් ) - (තනතුරු 06)**

| | | |
|---|---|---|
| **සුදුසුකම්** | : | තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම හෝ රජයේ කාර්මික විද්‍යාලය විසින් නිකුත් කරන ලද ජාතික තාක්ෂණ සහතිකය (NCT) ලබා තිබීම හෝ සමාන සුදුසුකමක් ලබා තිබීම. |
| **වැටුප් පරිමාණය** | : | MA 2-2, රු. (30,310 – 300X10,– 350X7 – 600X4 – 710X20 – 52,360) |
| **ආරම්භක පියවර** | : | අංක 2/2016 දරන කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව රු. 30,310/- කි. |
| **සටහන** | : | සැලසුම් ශිල්පීන් සතු තනතුරට අදාළ පළපුරුද්ද වැඩි වාසියක් ලෙස සලකනු ලැබේ. |
| **වයස** | : | අවු 18 ට අඩු නොවිය යුතු අතර, අවු 45 ට වැඩි නොවිය යුතුය. |

අභ්‍යන්තර සුදුසුකම් ප්‍රකාරව අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අනෙකුත් ප්‍රතිලාභ :**

- ජීවන වියදම් දීමනාව
- සංවිධානය විසින් සේ.අ.අ. සඳහා 12% ක සහ සේ.භා.අ. සඳහා 3% ක දායකත්වයක්
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ඕනෑම අනෙකුත් දීමනා

ජීවදත්ත සමග අදාළ සහතිකවල පිටපත් ඇතුළු අයදුම්පත් 2021.08.02 වෙනි දින හෝ ඊට පෙර "අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, 99/1, ජාවත්ත පාර, කොළඹ 05" වෙත ලැබෙන පරිදි ලියාපදිංචි තැපැල් මගින් ඉදිරිපත් කළ යුතුය.

රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ රජයේ ආයතනවල සේවකයන් ඔවුන්ගේ අදාළ ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ, අයදුම් කරන තනතුර සඳහන් කරන්න.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය,**
**99/1, ජාවත්ත පාර, කොළඹ 05.**